# රජයේ නිවේදනය

## ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

## ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත

### මහජන අදහස් හා යෝජනා කැඳවීම

**පසුබිම**

රටේ ආර්ථික සංවර්ධනය සහ ජීවිතයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ ඉහල නැංවීම සඳහා කාර්යක්ෂම සහ ලාභදායී ප්‍රවාහන පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් අතර සබඳතාව ජාලගත කිරීම, ගමනාගමනය සඳහා වැය වන පිරිවැය සහ කාලය අඩුකිරීම මගින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, විශ්වසනීයබව ඉහල නැංවීම සහ විවිධ වූ යෙදවුම් කණ්ඩායම් මෙන්ම පුලුල් වෙළඳපොළ වෙත පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම වැනි විවිධ ආකාරයන්ගෙන් ප්‍රවාහන අංශය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වයක් ලබාදේ.

ප්‍රවාහන අංශයේ ප්‍රධාන නියාමන ආයතනය වනුයේ ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයයි. අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රය නියාමනය සහ පරිපාලනය කිරීමට ආයතන ගණනාවක් ක්‍රියාත්මක වේ.

දුම්රිය දෙපාර්තමේන්තුව රටේ එකම දුම්රිය සේවා සපයන්නා ලෙස කටයුතු කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බස්රථ මගින් ප්‍රවාහනය කිරීම විමධ්‍යගත විෂයයක් වන්නේය. කෙසේවෙතත්, රජයට අයත් බස් රථ මෙහෙයවීම සහ නියාමනය සිදුකරනු ලබනුයේ අමාත්‍යාංශට යටතේ පවතින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයයි. පෞද්ගලික බස් ක්ෂේත්‍රය නියාමනය කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජා.ග.කො.ස) සහ පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි යන ආයතන දෙකෙහිම වගකීමක් වේ. ජාතික ගමනාගමන කොමිෂන් සභාව ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අතර එය අන්තර් පළාත් පුද්ගලික බස් රථ ප්‍රවාහන සේවාව නියාමනය කරයි. එක් එක් පළාත් සභාව යටතේ ස්ථාපිත කොට ඇති පළාත්බද ප්‍රවාහන අධිකාරි මගින් පළාත තුළ පුද්ගලික බස් රථ සේවා නියාමනය කරයි.

ඔම්නි බස් රථ මගින් සිදුකරන මගී ප්‍රවාහනයට අදාළ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම මෙන්ම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම සහ මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලන කාර්යක්ෂම බස් රථ සේවයක් සහතික කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන නියාමන රාමුවක් ස්ථාපිත කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වගකීමක් වන්නේය.

ඉහළ යමින් පවතින සහ විවිධාකාර වූ ප්‍රවාහන ඉල්ලුමට ඵලදායී ලෙසින් ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අංශයට වත්මනෙහි නොහැකි වී ඇති අතර ප්‍රවාහන සේවා සපයනු ලබන්නේ ආර්ථිකයට විශාල පිරිවැයක් දරමිනි. ප්‍රවාහන ක්ෂේත්‍රයේ දුර්වල කාර්යසාධනය සඳහා මූලිකවම වගකිව යුත්තේ ආයතනික ව්‍යුහයේ දුර්වලතා, තාර්කික උපායමාර්ගික රාමුවක් නොමැතිවීම, දුර්වල ආයෝජන සැලසුම්කරණය සහ තීරණ ගැනීමේ නිලධාරීවාදී ස්වභාව යයි.

ඉහත සඳහන් කරුණු හේතුකොටගෙන ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 1991 නොවැම්බර් 27 සහ 2009 වසරේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලද දැනට පවත්නා ප්‍රවාහන ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත්කොට ඇත. මෙම විද්වත් කමිටුව ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන්, නියෝජිත ආයතන සහ විශේෂඥ දැනුමැති පුද්ගලයන්ගෙන් සමන්විත වේ.

එම කමිටුව විසින් මේ වන විටත් ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත් ලේඛනය සකස් කර ඇති අතර එම ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත් ලේඛනය තුලින් ප්‍රවාහන සේවා කළමනාකරණය සහ සම්බන්ධීකරණය සඳහා ආයෝජනය සහ සංවර්ධනය පිණිස ප්‍රතිපත්ති අරමුණු, ප්‍රතිපත්ති විධාන සහ ප්‍රතිපත්ති මූලධර්ම සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත සම්බන්ධයෙන් මහ ජනතාවගෙන්, විශේෂඥයන්ගෙන්, වෘත්තිකයන්ගෙන්, ආයතන සහ සංවිධානවලින් ලිඛිත අදහස් හා යෝජනා කැඳවීමට කමිටුව අපේක්ෂා කරයි.

ඒ අනුව පහත දැක්වෙන යෝජිත ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම් පත පිළිබද, ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම් කැඳවනු ලැබේ.

## ප්‍රතිපත්ති තාර්කිකය

ශ්‍රී ලංකාවේ වත්මන් ප්‍රවාහන පද්ධතියෙහි සැලකිය යුතු වැඩිදියුණු කිරීම් කළ යුතුව තිබේ. අධික කාලය, ශක්තිය සහ සම්පත් භාවිතය කෙරෙහි හේතු වී ඇති පවත්නා අකාර්යක්ෂමතාවන්ගෙන් සහ පාරිසරික තත්ත්වය පහත වැටීම (හායනයේ) වර්ධනය වෙමින් පවතින උපනතීන්ගෙන් සහ ආරක්ෂක ප්‍රමිතීන්වල අඩුවීමෙන් මෙය ප්‍රත්‍යක්ෂ වේ.

දැනට පවතින ප්‍රවාහන පද්ධතීන්හි ඵලදායී ඒකාබද්ධවීමක් නොමැතිවීම, පොදු ප්‍රවාහනයේ ඇති අකාර්යක්ෂමතා, පොදු ප්‍රවාහනය හා විකල්ප ප්‍රවාහන සේවා, පෞද්ගලික රථවාහන මෙහෙයුම් සහ කළමණාකරණයේ ආකාරයක්ෂමතා, ප්‍රවාහනය හා සම්බන්ධ යටිතල පහසුකම් වල ධාරිතාවයේ සීමා සහිත බව, ප්‍රමානවත් නොවන ප්‍රවාහන ඉල්ලුම් කළමනාකරණ මැදිහත්වීම්, පාර්ශවකාර ධාරිතාවය අඩුබව, සම්බන්ධීකරණය කරනු නොලැබූ ඉඩම් පරිහරණ සංවර්ධනය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම් දිරිමත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති විධාන හිගකම වත්මන් තත්ත්වය සඳහා බලපෑ ප්‍රධාන හේතු වේ.

## අරමුණු

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා මග පෙන්වීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු කරනු ලබයි. එමගින් පහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- ප්‍රවාහන යටිතල පහසුකම් සහ සේවා කාර්යක්ෂම වීමෙ සහ ශ්‍රී ලංකාවේ ජාතික, පළාත් සහ ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ඉලක්ක සමග අනුගත විමේ අවශ්‍යතාව පෙන්නුම් කිරීම.

- රජයේ උපායමාර්ගික අරමුණු සහ ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම පිණිස ප්‍රවාහන පද්ධති වැඩි දියුණු කිරිම සඳහා ප්‍රවාහන අංශයේ පාර්ශවකරුවන්ට අවශ්‍ය මාර්ගෝපදේශනය සැපයීම.

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීම සඳහා අවශ්‍ය ආයෝජන ප්‍රමුඛතාවන් සහ සංවර්ධන ඉලක්කයන්හි ගෝලීය ප්‍රවණතා සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් මග පෙන්වීම.

- ප්‍රවාහන අංශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සේවා කළමනාකරණය පිළිබඳව දිගු කාලීන තීරණ ගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට වේදිකාවක් සැපයීම.

**ප්‍රතිපත්ති මූලධර්ම**

- ප්‍රවේශ වීමට පහසු ප්‍රවාහන පද්ධති

  ප්‍රවාහන පද්ධති සැලසුම් කළ යුතු වන්නේ පුරවැසියන්ගේ සහ ව්‍යාපාරයන්හි මූලික ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමට සහ නව තාක්ෂණවේද සහ ආශ්‍රිත සංවර්ධනයන් භාවිතා කරමින් එකිනෙක ඌනපූරණය කිරීම පිණිස සියලු ප්‍රවාහන පද්ධති සාධනීය සහ කාර්යක්ෂමව ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම පිණිසය. ප්‍රවාහන සේවා කරා පහසු සුගම ප්‍රවේශයක් සියලු මගීන්ට තිබිය යුතුය.

- බලශක්ති කාර්යක්ෂමතාව සහ පාරිසරික ආරක්ෂාව

  සියලුම ප්‍රවාහන ක්‍රම කාර්යක්ෂම සහ පිරිවැය පිරිමැසුම් බලශක්ති ප්‍රතිපත්තියක් කරා මෙහෙයවිය යුතුය. අවම පාරිසරික හානියකින් යුතුව තිරසාර ආකාරයකින් ප්‍රවාහන සේවා සැපයිය යුතු වේ.

- ආරක්ෂාව සහ සුරක්ෂිතතාව ඉහළ නැංවීම

  ප්‍රවාහන සේවා ආරක්ෂිත, සැප පහසු සහ විශ්වසනීය විය යුතුය. ප්‍රවාහන යටිතල පහසුකම් සැලසුම් කිරීමේදී කාන්තාවන්ට, ළමුන්ට, වැඩිහිටියන්ට සහ විශේෂ අවශ්‍යතා ඇති අයට සුරක්ෂිත පරිසරයක් සැපයිය යුතුය

- ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් ලබාදීම

  ආර්ථික සහ සමාජ සංවර්ධනයට උපකාරී වන, මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා පවතින සහ ඇති විය හැකි ඉල්ලුම ප්‍රමාණවත්ව සපුරාලන ප්‍රවාහන සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය සාධාරණ පිරිවැයකට වැඩි දියුණු කිරීම. පුද්ගලික අංශයේ ආයෝජන සහ රාජ්‍ය - පුද්ගලික හවුල්කාරිත්ව උපරිම කිරීම.

- ඉඩම් පරිහරණ සහ ප්‍රවාහන සැලසුම්කරණය ඒකාබද්ධ කිරීම

ගමන් දුර අවම කිරීමට සහ නව ප්‍රවාහන සහ ප්‍රවාහන නොවන මැදිහත්වීම්, නව තාක්ෂණවේද සහ ආශ්‍රිත උපායමාර්ගවල ආධාරයෙන් ජනගහණයේ ජීවනෝපාය, අධ්‍යාපනය සහ අනෙකුත් සමාජීය අවශ්‍යතා වැඩි දියුණු කිරීම පිණිස ඉඩම් පරිහරණ සංවර්ධනය සහ ප්‍රවාහන පද්ධති සංවර්ධනය ඒකාබද්ධ කිරීම.

**ප්‍රතිපත්ති ඉලක්ක**

- තිරසාර ආර්ථික සංවර්ධනයකට සහාය වීම පිණිස මගීන් සහ භාණ්ඩ කාර්යක්ෂමව ප්‍රවාහනය කිරීම ප්‍රවර්ධනය කිරීම
- සැමදෙනාටම සාධාරණ ප්‍රවේශයකට ඉඩ ප්‍රස්තා ඇති කිරීම පිණිස සමාජ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම
- හානි, තුවාල සිදුවීම සහ ජීවිත අහිමිවීම අවම කරන්නා වූ ආරක්ෂිත ප්‍රවාහන පද්ධතියක් සැපයීම.
- පාරිසරික තිරසාර බව ආරක්ෂා කිරීම හා සෞඛ්‍යය වැඩි දියුණු කිරීම.

**ප්‍රතිපත්ති විධාන**

- පොදු ප්‍රවාහන සේවාවන්හි ගුණාත්මකබව සහ විශ්වසනීයභාවය වැඩි දියුණු කර පොදු ප්‍රවාහන සේවා භාවිතයට ප්‍රමුඛතාව ලබා දීම. ආරක්ෂිත, සුවපහසු සහ විශ්වසනීය සේවාවක් සැපයිය හැකි සහ මගීන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන පොදු ප්‍රවාහන සේවා ප්‍රවර්ධනය කිරීම. පුද්ගලික වාහන භාවිතයෙන් ඉවත්ව පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන්නන්ගේ දායකත්වය ඉහළ නංවන සේවා කෙරෙහි ප්‍රමුඛතාව ලබා දීම.

- පොදු ප්‍රවාහන සේවා ජාලය ව්‍යාප්ත කර විවිධ පොදු ප්‍රවාහන සේවා පද්ධති ඒකාබද්ධ කිරීමේ හැකියාව සමග සේවා වාර ගණන වැඩි කිරීම. නාගරික පරිසරයේදී, අනෙකුත් ප්‍රවාහන මාධ්‍ය සමග සම්බන්ධතාව සහ ඒකාබද්ධ වීම ඉහළ නැංවීම සහතික කිරීම. ඉල්ලුම් විචල්‍යතාව (වාහන තදබදය අධික සහ තදබදය නොමැති අවස්ථා සැලකීම) සඳහා කඩිනම් ගැලපීම් සඳහා විධිවිධාන යෙදීම. එක් ප්‍රවාහන මාධ්‍යයකින් තවත් ප්‍රවාහන මාධ්‍යකට මාරුවීම අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන ජාල සැලසුම් කිරීම. එකිනෙක ඌනපූරණය කරන සේවාවන්ට ප්‍රමුඛතාව ලබා දී තරඟකාරී සේවා අධෛර්යමත් කිරීම. ග්‍රාමීය ප්‍රදේශයන්හි පොදු ප්‍රවාහන සේවා වාහනවල භාණ්ඩ ප්‍රවාහනයට ඉඩ ලබාදීමට විධිවිධාන සැලැස්වීම.

- පොදු ප්‍රවාහන සේවාවන්ට පහසුවෙන් ළඟාවිය හැකි බව, සාධාරණත්වය සහ දැරිය හැකි බව වැඩි දියුණු කිරීම. ප්‍රවේශය වැඩි දියුණු කර බස් නැවතුම් සහ පර්යන්ත වෙත පයින් ගමන්කිරීමට ඇති

දුර අවම කිරීම. වයස, ස්ත්‍රී,  පුරුෂ බව හෝ හැකියාව කවරක් වුවද, මගීන්ට සියලු වාහන වෙත පහසු ප්‍රවේශය තිබිය යුතුය. ගාස්තු ආකර්ෂණීය සහ දැරිය හැකි විය යුතු අතර වෙනත් ප්‍රවාහන මාධ්‍ය වෙත  මාරු වීම් අධෛර්යමත් නොකළ යුතුය.

- විකල්ප ප්‍රවාහන සේවාවන්හි (Para transit) කාර්ය භාරය හඳුනාගෙන ගමනාන්තය දක්වා ප්‍රවාහන පහසුකම් සැපයීම. අඩු ඉල්ලුමක් ඇති ප්‍රදේශ වෙත  සහ තොරතුරු තාක්ෂණ මෙවලම්වල උපකාරයෙන් ගමනාන්තය දක්වා  ප්‍රවාහන සේවා සැපයීමට විකල්ප ප්‍රවාහන පහසුකම් සපයන්නන් හට පහසුකම් සැපයීම.

- යෝග්‍ය අවස්ථාවන්හිදී අභ්‍යන්තර ජල මාර්ග ඔස්සේ ප්‍රවාහනය, වෙරළබඩ නාවික ගමනාගමනය සහ අභ්‍යන්තර ගුවන් ගමන් වැඩිදියුණු කර ව්‍යාප්ත කිරීම. අභ්‍යන්තර ජල මාර්ග ඔස්සේ ප්‍රවාහන, වෙරළබඩ නාවික ගමනාගමන හෝ අභ්‍යන්තර ගුවන් ගමන්වලදී සාධාරණ මිලකට වඩා වේගවත් ප්‍රවේශයක් සැපයීමට හැකි හෝ මාර්ග තදබදය අඩුකිරීම පිණිස රථවාහන වෙනතකට හැරවීමට හැකි ගමන් ආරම්භක ස්ථාන සහ ගමනාන්ත හඳුනාගැනීම.

- යෝග්‍ය අවස්ථාවන්හිදී මෝටර් රථ නොවන ප්‍රවාහන ක්‍රම භාවිතය වැඩිදියුණු කර ව්‍යාප්ත කිරීම. පොදු ප්‍රවාහන සේවා වෙත ප්‍රවේශය සපයන මෝටර් රථ නොවන ප්‍රවාහන ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදීම. හැකි විටදි, සම්බන්ධතා සහ ආරක්ෂිතව පාර හරහා මාරුවීමේ ස්ථාන සහ අයහපත් කාලගුණයෙන් ආරක්ෂාව සැපයීම. මෝටර් රථ භාවිතා නොවන  ප්‍රවාහන මාර්ග සහ ජාල පිළිබඳ තොරතුරු සැපයීම.

- මගී සහ භාණ්ඩ ප්‍රවාහනය වැළැක්වීම හෝ අඩු කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කර ප්‍රවාහන සේවා ආරක්ෂිතව හා ඵලදායී  ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම. හැකි සෑම අවස්ථාවකදීම ප්‍රවාහන මෙහෙයුම්, සන්නිවේදන සහ තොරතුරු රැස්කිරීම සහ ප්‍රචාරණය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේද අන්තර්ගත කිරීම. සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය සහිතව ප්‍රවාහනය ආශ්‍රිත දත්ත ගබඩා සකස්කර පවත්වාගෙන යාම.

- ප්‍රවාහන පද්ධති සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය තුලට දේශගුණික සහ ආපදා ප්‍රත්‍යාස්ථිතිය අන්තර්ගත කිරීම. යම් අහිතකර බලපෑම් හඳුනාගැනිම පිණිස ආපදා බලපෑම් තක්සේරු භාවිතා කර සැලසුම් අදියරේදී බලපෑම් අවමකිරීමේ ක්‍රියාමාර්ග අන්තර්ගත කිරීම. කවර හෝ හදිසි ආපදා අවස්ථා තත්වයන් සඳහා විකල්ප හඳුනාගැනීම. (ඉවත් කිරීම හෝ ගමන් මග වෙනස් කිරීම)

- සියලු පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණයෙන් වඩා හොඳ රථවාහන සහ ඉල්ලුම් කළමනාකරණ උපක්‍රම හරහා ප්‍රවාහන පිරිවැය සහ ගමන් කාලය අඩුකිරීම. ඉල්ලුම් කළමනාකරණ උපක්‍රම සඳහා ප්‍රවාහන නොවන මැදිහත්වීම් සලකා බැලීම. රථවාහන ගමනාගමන කළමනාකරණය සහ ප්‍රවාහන මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිස බුද්ධිමය ප්‍රවාහන පද්ධති මෙවලම් (පරිගණක යෙදුම්) භාවිතා කිරීම.

- වඩා ඉහළ මෙහෙයුම් ආයු කාලයක් සහිත බලශක්ති කාර්යක්ෂම සහ වායු දූෂණය අඩු වාහන භාවිතය ප්‍රවර්ධනය කිරීම. සමස්ත ගමන / සේවය සඳහා බලශක්ති කාර්යක්ෂමතාව සලකා බැලීම. එක් එක් වාහනයේ විමෝචන මට්ටම අධීක්ෂණය කිරීම. ප්‍රවාහනය සඳහා පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම. සියලු ප්‍රවාහන මැදිහත්වීම්වලදී විමෝචන මට්ටම සහ ඉන්ධන කාර්යක්ෂමතාව කෙරෙහි දායකත්වය ඇගයීම.

- නීති රීති සහ රෙගුලාසි කෙරෙහි වඩා යහපත් අනුකූලතාවයක් සඳහා රථවාහන නීති ප්‍රමාණවත් පරිදි සහ ඵලදායී ලෙස බලාත්මක කිරීම සහතික කිරීම. විනිවිදභාවය පවත්වා ගැනීම පිණිස සාක්ෂි පාදක කොටගත් බලාත්මක කිරීමේ උපක්‍රම භාවිතා කිරීම.

- ළමුන්, කාන්තාවන්, රෝගීන්, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් වැඩිහිටියන් ඇතුළුව සියලු දෙනාගේ ප්‍රවාහන අවශ්‍යතා ප්‍රමාණවත් පරිදි සපුරාලීම සහතික කිරීම. සඵල මිලකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කර ඉලක්ක ප්‍රදේශ / කණ්ඩායම්වලට යම් සහනාධාර අවශ්‍යතාවක් වේ නම් ඒවා හඳුනාගැනීම.

- අනතුරු, තුවාල සහ ජීවිත හානි අවම කිරීම සඳහා ප්‍රවාහන සුරක්ෂිතතාව තහවුරු කිරීම. යටිතල පහසුකම් සංවර්ධනය සහ මෙහෙයුම් සඳහා සුරක්ෂිතතා විගණන ප්‍රවර්ධනය කිරීම. අනතුරු අවධානම වැඩි ස්ථාන, තුවාල සහ හානි පිරිවැය පිළිබඳ විස්තර සහිතව විස්තීරණ හා යාවත්කාලීන අනතුරු දත්ත ගබඩාවක් පවත්වා ගැනීම.

- කාර්යක්ෂම ප්‍රවාහන සේවා සැපයුමක් ඇතිකරලීමට නිපුණතා සංවර්ධනය සඳහා ධාරිතා ගොඩනැංවීමට පහසුකම් සැපයීම. සෑම මට්ටමක් සඳහාම වත්මන් නිපුණතා සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන සියලු පාර්ශවකරුවන් සඳහා පුහුණු පහසුකම් සැපයීම.

- මානව සම්පත් සංවර්ධනය සහ අති නවීන මෙවලම් සහ උපකරණ සැපයීම මගින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ මෙහෙයුම් සහ කළමනාකරණයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිණිස ආයතනික ධාරිතාවය වර්ධනය කිරීම.

- අවකාශ අසමතුලිතා නිවැරදි කිරීම පිණිස ඉඩම් පරිහරණය සහ ප්‍රවාහන සැලසුම්කරණය ඒකාබද්ධ කිරීම හා එමගින් ප්‍රවාහනය සඳහා ඇති ඉල්ලුම අවම වන අතර ගමනේ දුර අඩු වනු ඇත.

- ප්‍රවාහන ක්‍රියාකාරකම් සඳහා පුද්ගලික අංශයේ මැදිහත්වීම දිරිමත් කර පහසුකම් සැපයීම. ප්‍රවාහන පද්ධති සංවර්ධනයේ සහ සහ සේවා සැපයුමේදී පුද්ගලික අංශයේ ආයෝජන සහ රාජ්‍ය - පුද්ගලික හවුල්කාරීත්ව උපරිම කිරීම.

- පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන අංශය ආශ්‍රිත දැනුම ප්‍රචාරණය කිරීම.

**ක්‍රියාත්මක කිරීම**

i. උපායමාර්ග-

ගමනාගමනය සඳහා ඇති සමස්ත අවශ්‍යතාව සහ ඉල්ලුම අඩුකිරීම. විශේෂයෙන්ම ඇවිදීම, බයිසිකල් පැදීම සහ පොදු ප්‍රවාහනය සහ තවත් නව්‍ය ප්‍රවේශ පද්ධති වඩා හොඳින් සැලසුම් කිරීම් සමග තිරසාර ප්‍රවාහන ක්‍රම වෙත යොමුවීම ප්‍රවර්ධනය කිරීම. කාර්යක්ෂම තාක්ෂණය භාවිතා කිරීම මෙන්ම වාහන සඳහා සිටින මගී සංඛ්‍යාව සහ පැටවුම් මට්ටම් ඉහළ නැංවීම මගින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. පළමු ප්‍රමුඛතා තුන සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නැංවීම සහ පාරිසරික සීමා ඉක්මවා නොයන්නේ නම් පමණක් ධාරිතාව ඉහළ නැංවීම.

ii. වගකීම

ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග, ව්‍යාපෘති සහ වැඩසටහන් සකස් කිරීම, කාර්යසාධක දර්ශක හඳුනා ගැනීම සහ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සහ දේශීයව සහ ගෝලීයව පිළිගත් ප්‍රතිපත්ති විධාන ප්‍රකාරව සාක්ෂාත් කරගත යුතු ඉලක්ක පැනවීම සඳහා එක් එක් පාර්ශවකාර සංවිධානය වගකිව යුතු වේ. ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සමග අනුකූල වන්නේද යන්න පිළිබඳව ජාතික සම්බන්ධීකරණ කමිටුව සමාලෝචනය කරනු ඇත.

iii. අධීක්ෂණය සහ ඇගයීම

සියලු ප්‍රවාහන ව්‍යාපෘති, වැඩසටහන්, මෙහෙයුම් සහ මැදිහත්වීම් ක්‍රමානුකූලව අධීක්ෂණය කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ඇගයීමට නියමිතය. අධීක්ෂණය හා ඇගයීම සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීම සහ පවත්වා ගැනීම සඳහා පාර්ශවකාර සංවිධාන සාමූහිකව හෝ තනි තනිව වගකිව යුතු වේ.

අවශ්‍ය වන්නේ නම්, ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත www.transport.gov.lk හෝ www.ntc.lk වෙබ් අඩවිවලින් භාගත කළ හැක.

ලිඛිත අදහස්,යෝජනා හා කරුණු දැක්වීම් පහත සඳහන් කර ඇති ලිපිනයට ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති වෙත තැපැලෙන් හෝ අතින් ගෙනවිත් බාර දීමට හැකිය. කරුණු දැක්වීම් විද්‍යුත් තැපැලෙන් හෝ ෆැක්ස් මගින් ද යොමුකළ හැකි අතර අදහස්,යෝජනා හා කරුණු දැක්වීම් 2018 පෙබරවාරි 28 වැනි දිනට පෙර එවිය යුතුය.

කරුණාකර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ හෝ මුල් පිටුවේ “ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා යෝජනා” යන්න සඳහන් කරන්න.

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
අංක 241, උද්‍යාන පාර,
කොළඹ -05.

වි.තැපැල: **chairman@ntc.gov.lk** / **info@ntc.gov.lk**

**ෆැක්ස්: 011 2503725 / 011 2058138**

ලේකම්,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
7වන මහල, සෙත්සිරිපාය- 2වන අදියර,
බත්තරමුල්ල.

වි.තැපැල: **mintransport@sltnet.lk/** **secmintransport@gmail.com**

**ෆැක්ස්: 011 2865093 / 011 2187224**

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව